# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2309/09 – 2022 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා – 2022.12.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/42.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ අංක 2021.03.17 දිනැති හා අංක 2219/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රණාල, ජල්තර, අංක 336 හි පදිංචි ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මයා සහ කොළඹ 08, ඇල්විටිගල මාවත, වික්ටෝරියා පෙදෙස, අංක 17 හි පිහිටි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38260 – 19 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/02/2017/42.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය: A/28/2021

ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මයා,
අංක 336,
ජල්තර,
රණාල.
පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,
අංක 17, වික්ටෝරියා පෙදෙස,
ඇල්විටිගල මාවත,
කොළඹ 08.
දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රති සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඒ. එම්. අසංග දයාරත්න වන මා පත්කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළ ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මහතාට,

1. ගෙවන ලද වැටුපෙහි විෂමතාවයන් තිබේ ද ? යන්නත්,
2. ජ්‍යෙෂ්ඨත්වය අහිමි කිරීමක් කර තිබේ ද? යන්නත්,

එමගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනය කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

අදාළ පරීක්ෂණ දිනයන්හි රූපසිංහ මහතා නොපැමිණි අතර ඒ සඳහා වෙනත් දිනයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ අනුව 2022.09.27 වැනි දින නැවත නඩුව කැඳ වූ අවස්ථාවේ දී ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.

එම ලිපිය මගින් ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මහතා ප්‍රකාශ කරනුයේ තමා මෙම ආරාවුල විසඳීම සඳහා කළ ඉල්ලීම ඉල්ලා අස්කර ගන්නා බවත් ඉදිරියට යෑමට අපේක්ෂා නොකරන බවත් දනුම් දී ඇති බැවින් නඩුව සඳහා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් නඩු ගොනුවේ ක්‍රියාවන් අවසන් කර ගොනුව පියවමි. මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ඒ. එම්. අසංග දයාරත්න,
බේරුම්කරු

2022 ඔක්තෝබර් මස 21 වැනි දින දී ය.

EOG 12 -0071

මගේ අංකය: IR/COM/02/2018/117.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.02.05 දිනැති හා අංක 2213/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගනේමුල්ල, වැලිපිල්ලෑව, අංක 270/2 හි පදිංචි යූ. ජී. සංජීව නෙළුම්දෙණිය මයා සහ කොළඹ 15, රොක්හවුස් පටුමග, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.**

A/02/2021
IR/COM/02/2018/117

යූ. ජී. සංජීව නෙළුම්දෙනිය,
අංක 270/2, වැලිපිල්ලෑව,
ගනේමුල්ල.
පළමු පාර්ශ්වය

එදිරිව
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග,
කොළඹ 15.
දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ ''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පරිගණක ජාල පරිපාලක තනතුරේ සේවය කරන යූ. ජී. සංජීව නෙලුම්දෙනිය මහතාට එම තනතුර සඳහා M M -1 -1 වැටුප් කාණ්ඩය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදු ව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

මේ පිළිබඳව පරීක්ෂණයන් 2022.06.23, 2022.09.27 සහ 2022.10.17 වැනි දින පවත්වන ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ජයන්තා පන්නිලගේ පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් වැඩ බලන මානව සම්පත් කළමණාකරු, ඩී. එම්. එස්. කේ. විජේතුංග මහතා සහ කළමනාකරණ සහකාර ආර්. ඒ. ඩී. ප්‍රියංගිකා මහත්මිය සහභාගී විය. සමථය පිළිබඳව සාකච්ඡා කල අතර සමථය පිළිබඳව එකඟතාවයක් නොතිබූ අතර පැමිණිලිකරු 2022.09.21 දිනැති ලිපියක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය මෙම නඩුව පවත්වාගෙන යාමට නොසතුට පල කර සිටින බැවින් මෙම නඩු ගොනුව ඉල්ලා අස්කර ගන්නා බවයි. ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීම මත නඩු ගොනුව තවදුරටත් පවත්වාගෙන යාම නොහැකි බැවින් නඩු ගොනුවේ කටයුතු අවසන් කරමි. ඒ අනුව බේරුම්කරණය සඳහා යොමු කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. ඔහුට කිසිදු සහනයක් නොලැබේ.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ඒ. එම්. අසංග දයාරත්න,<br>
බේරුම්කරු.

2022 ඔක්තෝබර් මස 17 වැනි දිනදී ය.

EOG 12 -0072

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.